# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2096/47 - 2018 නොවැම්බර් මස 07 වැනි බදාදා - 2018.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ජේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

DEV/LND/02/ACQUI/04-27.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවයේ විස්තර:*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාඔටුන්න උතුරු ග්‍රාම නිලධාරී වසමේ, නාඔටුන්න ගමේ පිහිටි මාර/2742 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 ඉඩම් කොටස (ප්‍රමාණය හෙක්ටයාර් 0.7669ක් පමණ) :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: පරගහදෙනියෙවත්ත, හෙට්ටිගමගෙවත්ත, පරගහහේනවත්ත, හෙට්ටිගමගෙහේන, පරගහදෙනියහේන; විස්තරය: ගෙවත්ත සහ මිශ්‍ර භෝග වගාවක් ඇත; හිමිකම් කියන්නාගේ නම: ආරුමුගම් රාසලිංගම්, විජේසේකර අජිත් චන්ද්‍ර අබේගුණවර්ධන; ප්‍රමාණය: හෙක්. 0.7669.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2018 දෙසැම්බර් මස 26 වැනි දින පෙරවරු 10.00 ට දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි. තව ද 2018 දෙසැම්බර් මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

රංජිත් යාපා,
ප්‍රාදේශීය ලේකම්,
දෙවිනුවර.

අත්කර ගැනීමේ නිලධාරී,
2018 නොවැම්බර් මස 02 වැනි දින,
දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

11-903

1A - G 28884 - 25 (2018/11)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශුද්ධි පත්‍රයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය : මතු /ඉඅ* /4/29.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/5/2001/VEP/234.

2018 අප්‍රේල් මස 11 වැනි දින, අංක 2066/39 දරන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* අත්කර ගන්නා ලද ඉඩමේ කැබලි අංක 1 වෙනුවට එය කැබලි අංක 2 හා 3 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

01. **කැබලි අංක 02**

ඉඩමේ නම: අබේතැන්න වත්ත; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 1.7972

02. **කැබලි අංක 03**

ඉඩමේ නම: කරම්පැතර; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.2310.

ශ්‍යාමා පී කාරියවසම්,
ප්‍රාදේශීය ලේකම්,
මතුගම.

2018 ඔක්තෝබර් මස 24 වැනි දින,
මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

11-904

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.